නියත වශයෙන්ම කාන්තාවක් වියන ලද පොරෝණයක් රැගෙන අල්ලාහ්ගේ දූතයාණන් -සල්ලල්ලාහු අලය්හි වසල්ලම්- තුමා වෙත පැමිණියාය.

සහ්ල් ඉබ්නු සඃද් -රළියල්ලාහු අන්හු- තුමා විසින් වාර්තා කරන ලදී. නියත වශයෙන්ම කාන්තාවක් වියන ලද පොරෝණයක් රැගෙන අල්ලාහ්ගේ දූතයාණන් -සල්ලල්ලාහු අලය්හි වසල්ලම්- තුමා වෙත පැමිණ මෙය ඔබට අන්දවනු පිණිස මම ගෙතුවෙමි යැයි පවසා සිටියාය. එවිට නබි -සල්ලල්ලාහු අලය්හි වසල්ලම්- තුමා එහි අවශ්යතාවක් ඇත්තෙකු වශයෙන් එය අර ගත්හ. පසුව එතුමා අප වෙත බැහැරට පැමිණියහ. එය එතුමාගේ වේට්ටිය විය. එවිට පුද්ගලයකු, “මෙය මට අඳින්නට දෙන්න. මෙය කොතරම් අලංකාර ද!“ යැයි පවසා සිටියේය. එවිට එතුමා එසේය යැයි පවසා එතුමා සභාවේ වාඩි වූහ. පසුව හැරී ගොස් එය නමා ඔහු වෙත එවූහ. එවිට එම පිරිස ඔහු දෙස බලා, “ඔබ හොඳ දෙයක් කළෙහිය! නබි-සල්ලල්ලාහු අලය්හි වසල්ලම්- එහි අවශ්යතාවක් ඇත්තෙකුව සිට, එය ඇඳ ගත්හ. පසුව ඔබ එය ඉල්ලා ගත්තෙහිය. නියත වශයෙන්ම එතුමාගෙන් ඉල්ලා සිටින්නෙකු හරවා නොයවන බව ඔබ මැනවින් දන්නෙහිය.“ යැයි පවසා සිටියේය. එවිට ඔහු, “අල්ලාහ් මත දිවුරා පවසමි. නියත වශයෙන්ම මම එය අඳින්නට නොගත්තෙමි. එය මා ඉල්ලා
සිටියේ මාගේ කෆන් බවට එය පත්වනු පිණිසය.“ ඔහුගේ කෆනය එයම විය යැයි සහ්ල් - රළියල්ලාහු අන්හු- තුමා පවසා සිටියහ. [පූර්ව සාධක සහිත හදීසයකි] [ඒ හා සමානව ඉමාම් බුහාරි තුමාද වාර්තා කර ඇත]

මෙම හදීසයේ නබි -සල්ලල්ලාහු අලය්හි වසල්ලම්- තුමා ඔහුගේ ආත්මයට වඩා අන් අය කෙරෙහා ප්රමුඛත්වය ලබා දී ඇතැයි සඳහන් වේ. හේතුව එතුමාට අවශ්යව තිබූ මෙම පොරෝණය එම මිනිසා ට ලබා දී ඇත. තමන්ට තිබූ දැඩි අවශ්යතාව මත එතුමා එය ඇඳගත් බව පෙන්වා දෙයි. හේතුව කාන්තාවක් පැමිණ නබි -සල්ලල්ලාහු අලය්හි වසල්ලම්-තුමාට පොරෝණක් පිළිගැන්වූවාය. එවිට එතුමා වෙත මිනිසෙකු පැමිණ: මෙය කෙතරම් අලංකාරදැයි විමසා නබි-සල්ලල්ලාහු අලය්හි වසල්ලම්- තුමාගෙන් එය ඉල්ලා සිටියේය. දූතයාණන් -සල්ලල්ලාහු අලය්හි වසල්ලම්- එය ඉටු කළහ. එය ගලවා නවා ඔහුටම එය පිරිනැමූහ. ඇතැම් විවරණකරුවන් මෙම හදීසයේ ඇති ප්රයෝජන ගැන පවසා සිටියදී, දැහැමියන්ගේ සිහිවටනයන් තුළින් යම් බලපෑම් සිදු වනු ඇතැයි පවසා සිටියි. එය එසේ නොවේ. එසේ යම් බලපෑමක් සිදුවනුයේ නබි තුමාණන්ගේ ස්වභාවයෙන් පමණි. භාග්යයක හෝ යහපත සැලසීමක හෝ එතුමා හැර වෙනත් අය ඊට සමාන කළ නොහැක. සහාබාවරුන් පවා එතුමා හැර වෙනත් අය සමග ඔහු ජීවත්ව සිටියදී හෝ ඔහු මරණයට පත් වූ පසු හෝ එවැනි කටයුත්තක් සිදු කළ බවට සඳහන්ව නැත. එසේ යහපතක් වී නම් ඒ වෙත අපට වඩා ඔවුන් ඉදිරියෙන් සිටින්නට තිබුණි.

http://www.sunnah.global/hadeeth/si/show/5648